# මානව අයිතිවාසිකම් දිනය 2025

## "මානව අයිතීන්:අපගේ දෛනික අවශ්‍යතාවයකි"

ලංකා සභා රදගුරුවරුන්ගේ ප්‍රකාශනයකි

2025 වසරේ මානව අයිතීන් දිනය සමරණ අවස්ථාවේදී අප රටට අතිශය ප්‍රබල බලපෑමක් ඇතිකරමින් අහිමිවීම් සහ විනාශය ගෙන ආ දිත්වා සුළි කුණාටුව ගැන මෙනෙහි කරමු. මෙම දේශගුණික විපර්යාසයෙන් සිදුවූ හිදිසි විනාශය මගින්, සුරක්ෂිතභාවයට, සෞඛ්‍ය සම්පන්න බව සහ තිරසාර පරිසරයක් සඳහා අපට ඇති මූලික අයිතියට සිදුව ඇති තර්ජනාත්මක බලපෑමේ යථාර්තය පෙන්නුම් කරයි. මෙය හුදෙක් ස්වභාවික ව්‍යසනයක් නොව, දේශගුණික ප්‍රතිපත්ති සහ කාලයක් පුරාවට පැවති රජයන්ගේ පාලනක්‍රමයත්, සෑම පාලන තන්ත්‍රයකම පැවති දූෂණය යනාදී අංශයන් සමූහයකගේම අපොහොසත් බව පෙන්නුම් කරයි.

'මානව අයිතීන්:අපගේ දෛනික අවශ්‍යතාවයකි' යන මෙම වසරේ තේමාව මගින්, මානව අයිතීන් අපට අත්‍යවශ්‍ය කරුණක් මෙන්ම, ළඟා කර ගත හැකි, අපගේ දිනපතා ජීවිතයේ කොටසක් බව අපට සිහිපත් කරනු ලබයි. පසුගිය සති දෙක පුරාවට ලද අත්දැකීමෙන්, මානව අයිතීන් හුදෙක් පරමාදර්ශික නොව අපගේ ජීවිතයේ යහපැවැත්මට බද්ධ වී ඇති බව පෙන්නුම් කරන ලදී. මානව අයිතීන් වෙනුවෙන් පෙනී සිටින්නට ඇති අයිතිය සහතික කරන අතර මානව අයිතීන් වෙනුවෙන් පෙනී සිටින්නන්ගේ රැකවරණය ද සහතික කළ යුතු අතරම පාරිසරික අයිතීන් වෙනුවෙන් පෙනී සිටින්නන්ගේ ආරක්ෂාව කෙරෙහිද වැඩි අවධානමක් දැක්විය යුතුය.

දේශගුණික ආපදාවන් සහ නිරතුරුවම සිදුවන ස්වාභාවික විපත් වලින් තවදුරටත් ශ්‍රී ලංකාවේ ආර්ථික තත්වය දුර්වල වන අතරම, ශ්‍රී ලංකාවේ මානව අයිතීන් සුරැකීම ද තවදුරටත් ප්‍රබල අභියෝගයකට ලක්වේ. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ බොහෝ ලෙස කතා කරනු ලැබුවද, ක්‍රියාත්මක කර ඇති දෑ ස්වල්පයකි; උතුරේ සහ දකුණේ අතුරුදහන් වූවන්ගේ මව්වරුන්ගේ විලාපයන් තව දුරටත් නොසලකා හරිනු ලබයි. දිත්වා සුළි කුණාටුවෙන් දැඩි බලපෑමට ලක්වූවන් අතර සිටි මලයාහ මක්කල් ප්‍රජාවට, දේපල සහ ජීවනෝපාය අහිමිවීමෙන් තව දුරටත් බලපෑමට ලක්වෙන ලදී. LGBTQI ප්‍රජාව සහ කාන්තාවන්, දෛනිකව ප්‍රචණ්ඩත්වයට, හිංසනයට සහ තර්ජනයට ලක්වෙමින් වෙනස්කොට සැලකීමට පත්වේ. ශ්‍රී ලංකාවේ දුගී බව සැලකිය යුතු ඉතා ඉහළ අගයක් ගනු ලබයි, එය 2024 වසරේදී 24.5% ක් වැනි ඉහළ අගයක් ගන්නා අතර සුළි කුණාටුවේ බලපෑම මෙම තත්වය වඩා තීව්‍ර කරයි. ත්‍රිකුණාමලයේදී මෑතකදී වූ සිදුවීම් වලදී නීතිය පවත්වා ගැනීමට වෙර දරන පුද්ගලයන්ගේ නොහැකියාවත් අපගේ ප්‍රජාවන් අතර සාමයට බාධා කළ අන්තවාදීන්ගේ බලයත් පෙන්නුම් කරයි.

වගවීම සඳහා ස්ථාපනය කරන ලද ආයතන මගින් විසඳාලීමට ඇති බොහෝමයක් ගැටළු හමුවේදී, එම ආයතන උදාසීනව කටයුතු කරන බව අපගේ හැඟීමයි. අතුරුදහන් වූවන්ගේ කාර්යාලයෙන් කිසිදු ප්‍රතිඵලයක් නොදැක්වෙන අතරම වන්දි ගෙවීමේ කාර්යාලයට ස්වාධීනව කටයුතු කිරීමට සහ තීරණ ගැනීමට අවශ්‍ය බලතල නොමැත. ජාතික කාන්තා කොමිසම පිහිටුවීම අපි අගය කරනමුත් එය තවමත් සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක නොවන අතර අවශ්‍ය සම්පත් නොමැති බව අපගේ හැඟීමයි. ඉතා භයානක නීති රෙගුලාසීන් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අවලංගු කිරීමට රජය විසින් පොරොන්දු දෙනු ලැබුවද එම පනත් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතියි.

නව ව්‍යවස්ථාවන් සැකසීමට, රජය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙනීම පිළිබඳව අප කණස්සල්ලට පත්වෙමු. බලයේ සිටින රජයකට පමණක් තනිවම ව්‍යවස්ථාවක් සැකසිය නොහැක. මෙම කර්තව්‍ය සියලු ස්වාධීන ජනතා පාර්ශවකරුවන් වන, විපක්ෂය, සිවිල් සමාජය සහ මුළු රටේම සියලු ප්‍රජාවන්ගෙන් සමන්විත සාමූහික ප්‍රයත්නයක් විය

යුතුය. නව ව්‍යවස්ථාව, ජාතික සමගිය සහ සමගිකම ප්‍රවර්ධනයට වගවන පරිපාලන තන්ත්‍රයක් ඇති කිරීම, තනි පුද්ගලයෙකු මත කේන්ද්‍රගත ප්‍රබල බලතල සහිත විධායක ජනාධිපතිදූරය අහෝසි කිරීම, ස්වාධීන රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම, පාර්ලිමේන්තුව තුළ සියලු දෙනා නියෝජනය කළ හැකි වන ඡන්ද ක්‍රමයක් ප්‍රතිස්ථාපනය කිරීම සහ ආර්ථිකමය සමාජය සහ සංස්කෘතිකමය අයිතීන් ද ඇතුළත් වන වඩා පුළුල් අයිතිවාසිකම් පනතක් හඳුන්වා දීමත් සිදුකළ යුතුය.

විශේෂයෙන් මෙම අර්බුධකාරී අවස්ථාවේදී ශ්‍රී ලාංකීය ජනතාවගේ අයිතීන් සහ නිදහස ආරක්ෂණයට සහ ප්‍රවර්ධනයට ලංකා සභාව කැපව සිටින බව අප නැවත තහවුරු කරමු. ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීමේ කර්තව්‍යයට යොමුව ඇති මේ මොහොතේදී, දේශගුණික විපර්‍යාස වල යථාර්තයට මුහුණ දීමට සූදානම් ව සිටීමටත්, පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදයන් සහ ආපදා සහන කළමණාකරණය සඳහා රට සූදානම් ව සිටීමට ඇති අවශ්‍යතාව සපුරාලීමට ද අප වග බලා ගත යුතුය. එබැවින් ප්‍රතිපත්ති අවපාලනය නවතාලීමටත්, වඩා කාර්යක්ෂම සහ ශක්තිමත් රාජ්‍ය සේවයක් ඇතුළත් වූ පාලන තන්ත්‍රයක් යථාවත් කිරීමටත් ශක්තිමත් ස්වාධීන ආයතන ඉතා ඉක්මනින් ගොඩනැගීමට ක්‍රියා කරන ලෙස අප ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.

නව ව්‍යවස්ථාවක් ගොඩනැගීමට එක්ව කටයුතු කිරීමේදී, අපගේ දිනපතා ජීවිතයට සම්බන්ධ වූ මානව අයිතීන්ගේ මූලික ප්‍රතිපත්ති වෙනුවෙන් නැවත කැප වීමටත්, වගකීමක් සහ වගවීමක් සහිත පාලන තන්ත්‍රයක් නිර්මාණය කිරීමටත් මෙය ඉතා උචිත අවස්ථාවකි.

අතිගරු දුෂාන්ත රුද්‍රිගු රදගුරුතුමා
කොළඹ රදගුරු හිමි හා
ලංකා සභාවේ සභාපති රදගුරු හිමි

අතිගරු නිශාන්ත ප්‍රනාන්දු රදගුරුතුමා
කුරුණෑගල රදගුරු හිමි